// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1991/41 - 2016 නොවැම්බර් මස 02 වැනි බදාදා - 2016.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2016 වර්ෂයේ අංක 03 දරන උතුරු පළාත් ළදරුවන්ගේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

උතුරු පළාතේ, පළාත් සභාව විසින් 2016 වර්ෂයේ ජූලි මස 21 වැනි දින සම්මත කරන ලද 2016 වර්ෂයේ අංක 03 දරන උතුරු පළාත් ළදරුවන්ගේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2016 වර්ෂයේ ඔක්තෝබර් මස 28 වැනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

කේ. තෙයිවේන්ද්‍රම්,<br>
ලේකම්,<br>
සභාලේකම් කාර්යාලය,<br>
උතුරු පළාත් සභාව.

2016 ඔක්තෝබර් මස 28 වැනි දින,<br>
A9 පාර,<br>
කයිතඩි,<br>
සභාලේකම් කාර්යාලයේ දී ය.

**ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා නිරීක්ෂණය කිරීම සඳහා ද ඊට අනුශාංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තිය යි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ 2016 වර්ෂයේ අංක 03 දරන ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, උතුරු පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වේ. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.)

1A - PG 3211 — 27 (2016/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* වන කොටස

### ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා වූ අරමුණු සහ බලපත්‍ර ලබා දීම

**ප්‍රඥප්තියේ අරමුණ.**

2. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පැමිණෙන ළමුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය සහ යහපත සැලසීම තහවුරු කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වේ.

**බලපත්‍ර ලබා ගැනීම.**

3. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා (මෙහි මින්මතු ''පළාත් කොමසාරිස්'' යනුවෙන් හැඳින්වෙන) පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් නිකුත් කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

**බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීම.**

4. (1) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා බලපත්‍ර ලබා ගැනීමට 3 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘති පත්‍රයේ ප්‍රකාරව සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයකින් සහ නියමිත ගාස්තු සමග පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පළාත් කොමසාරිස් විසින්, අවශ්‍ය වන්නේ නම්, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන්, අපරාධ පිළිබඳ වාර්තාවක් ඇතුළු වැඩිදුර තොරතුරු ලබා දෙන ලෙසට ඉල්ලුම්කරුට නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක්ම අවශ්‍ය සියලු විස්තර පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු අඩංගු විය යුතු ය.

(3) අසත්‍ය, නොමග යවන සුළු හෝ වැරදි තොරතුරු හෝ විස්තර අඩංගු වන ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ඇත.

**පරීක්ෂා කිරීම.**

5. 4 වන වගන්තිය යටතේ බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු පසු, පළාත් කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්පත්‍රයට අදාළ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය පරීක්ෂා කර බලන ලෙසට පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුට බලය පවරනු ලැබිය යුතු ය.

**වාර්තාව.**

6. 5 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ නිලධාරියා විසින්, තම පරීක්ෂාව අවසන් වූ පසු, අදාළ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පැවැත් වූ පරීක්ෂාවේ අදාළ සියලු තොරතුරු ඇතුළත් වාර්තාවක් පළාත් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම්කරු ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට හෝ පවත්වාගෙන යාම සඳහා සම්බන්ධව කටයුතු කිරීමට සහ ළමයින් ඇසුරු කිරීමට යෝග්‍ය සහ සුදුසු තැනැත්තකු වන්නේ ද යන කරුණ ද වාර්තාවට ඇතුළත් විය යුතු ය.

**ලියාපදිංචි කිරීමේ බලපත්‍රය නිකුත් කිරීම.**

7. 6 වන වගන්තියේ සඳහන් වාර්තාව ලැබීමෙන් පසු, වාර්තාවේ සඳහන් කරුණු සහ නිර්දේශ ඇත්නම් ඒවා ද සලකා බැලීමෙන් අනතුරුව පළාත් කොමසාරිස්වරයා විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා බලපත්‍රයක් නිකුත් කළ යුතු ය ; නැතහොත් ඔහු විසින් දැනුම් දෙන හේතු මත ප්‍රතික්ෂේප කළ යුතු ය.

**බලපත්‍රයේ ආකෘතිය හා වලංගු කාලය.**

8. 7 වන වගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක් -

(අ) පළාත් කොමසාරිස්වරයා තීරණය කරනු ලබන ආකෘතියෙන් ;

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත්ව ;

(ඇ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දින සිට බලාත්මක වන පරිදි ;

(ඈ) කලින් අවලංගු කරන්නේ නම් මිස බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා, වලංගු විය යුතු ය.

**බලපත්‍ර අලුත් කිරීම.**

9. (1) 7 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අලුත් කරවා ගැනීම සඳහා එහි කාලය ඉකුත්වීමට දින තිහකට නොඅඩු කාලයකට පෙර, නියමිත ආකෘතියෙන් එම කාර්ය සඳහා සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයකින් සහ අලුත් කිරීම සඳහා නියමිත ගාස්තු ද සමග පළාත් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් අලුත් කරවා ගත හැකි ය.

(2) පළාත් කොමසාරිස් විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍ර අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ලැබීමෙන් පසුව -

(අ) නිකුත් කර ඇති බලපත්‍රයේ නියම හා කොන්දේසි බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර නොමැත්තේ නම් හෝ ඒවාට පටහැනි යම් දෙයක් සිදු කර නොමැත්තේ නම් ;

(ආ) මෙම ප්‍රඥප්තියේ විධිවිධානයකට හෝ එය යටතේ පැන වූ යම් නියෝගයකට හෝ මාර්ගෝපදේශයකට පටහැනිව බලපත්‍රලාභියා කටයුතු කර නොමැත්තේ නම්, හෝ

(ඇ) ළමුන් සම්බන්ධයෙන් වූ යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව බලපත්‍රලාභියා කටයුතු කර නොමැත්තේ නම්, බලපත්‍රය අලුත් කළ හැකි ය.

බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

10. (1) 7 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -

(අ) අසත්‍ය, නොමග යවන සුළු හෝ වැරදි තොරතුරු සැපයීම මගින් ලබා ගෙන ඇති බවට හෙළිදරව් වුවහොත් ;

(ආ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ එය යටතේ පැනවූ යම් නියෝගයකට හෝ මාර්ගෝපදේශයකට පටහැනිව ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය භාර තැනැත්තා කටයුතු කර ඇති බව හෙළිදරව් වුවහොත් ;

(ඇ) යම් ළමයකුගේ වැඩිම යහපත සඳහා අත්‍යාවශ්‍ය වන්නේ නම් ;

(ඈ) ළමුන්ගේ ආරක්ෂාවට ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය තර්ජනයක් බවට පත්ව ඇත්නම් ; හෝ

(ඉ) උපදෙස්වලට අනුකූලව ක්‍රියාකිරීම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය මගින් සිතාමතා පැහැර හැර ඇත්නම්, පළාත් කොමසාරිස්වරයා විසින් අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ, බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි, අත්හිටවනු ලැබුවේ නම් හෝ අවලංගු කරනු ලැබුවේ නම්, එම අත්හිටු වීම හෝ අවලංගු කිරීම පිළිබඳව බලපත්‍රලාභියා විසින් සපයන ලද ලිපිනයකට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව පළාත් කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියාට වහාම දැනුම්දිය යුතු ය.

හේතු දැන්විය යුතු බව.

11. අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් ලබා ගැනීම හෝ අලුත් කරවා ගැනීම සඳහා 7 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප වී ඇති විට, එම ප්‍රතික්ෂේප කිරීමට හේතු පළාත් කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතු ය. පළාත් කොමසාරිස් විසින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු, ඉල්ලුම්පත ඉදිරිපත් කළ තැනැත්තාට, ඉල්ලුම්පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව දැනුම් දිය යුතු ය.

අභියාචන.

12. (1) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් නිකුත් කිරීමට හෝ අලුත් කිරීමට කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප වීමෙන් හෝ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අත්හිටු වනු ලැබීමෙන් හෝ අවලංගු කරනු ලැබීමෙන් අගතියට පත් යම් තැනැත්තෙක් අවස්ථානුකූලව එම ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳ එම තැනැත්තා කරනු ලැබූ ලිඛිත දැන්වීම ලද දින සිට දින තිහක් ඇතුළත එම තීරණයට එරෙහිව පිළිවෙලින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ අමාත්‍යවරයා විසින් නම් කළ නීතිඥවරයකු වන තැනැත්තකුගෙන් සමන්විත කමිටුවකට අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ යම් අභියාචනයක් සම්බන්ධයෙන්, එම අභියාචනය සඳහා වූ දින හැටක් තුළ දී තීරණය කළ යුතු අතර, එම තීරණය වහාම අභියාචකට දැනුම් දිය යුතු ය.

(3) කමිටුව විසින්, සුදුසු යැයි එය සලකන්නේ නම්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ අභියාචනයක් සම්බන්ධයෙන් එහි තීරණය ලබා දීමට පෙර, පරීක්ෂණයක් පැවැත්විය හැකි ය.

(4) මෙම වගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් කමිටුවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

බලපත්‍ර පැවරිය නොහැකි බව.

13. බලපත්‍රලාභියා විසින් බලපත්‍රයක් වෙනත් තැනැත්තකු වෙත පවරනු නොලැබිය යුතු ය.

බලපත්‍රලාභියාගේ යුතුකම.

14. (1) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සේවා සැපයීමට බලපාන, හෝ සම්බන්ධ අධීක්ෂණ නිලධාරියකු හෝ කළමනාකරණ නිලධාරියකුගේ වෙනස්වීමක් ද ඇතුළු, එහෙත් එයට සීමා නොවූ තොරතුරු වෙනස්වීමක් පළාත් කොමසාරිස්වරයා වෙත දැන්වීම බලපත්‍රලාභියාගේ වගකීම වන්නේ ය.

(2) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම කලින් කල වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

## *II* වන කොටස

### ළමා දිවා සුරැකුම් සේවා

පොදු මූලධර්ම

15. ළමා දිවා සුරැකුම් සේවා සැපයීම පහත මූලධර්මවලට යටත්ව සිදු කළ යුතු ය :-

(අ) ළමයාගේ වැඩීම යහපත පිළිබඳ උපරිම සැලකිල්ල ;

(ආ) ළමයෙකුට ළමා රැකවරණ සේවා සැපයීම -

I. ළමයා ආරක්ෂා වන පරිදි ;

II. ළමයාගේ ගෞරවය හා පෞද්ගලිකත්වය සුරැකෙන පරිදි ;

III. ළමයාගේ සෞඛ්‍ය සහ සුබසිද්ධිය ප්‍රවර්ධනය වන පරිදි ; සහ

IV. ළමයාට ධනාත්මක අත්දැකීමක් වන පරිදි සිදු කළ යුතු බව.

(ඇ) ළමයාගේ නිර්මාණශීලී චෛතසික, බුද්ධිමය, භාෂාමය, ශාරීරික, විනෝදාස්වාදාත්මක හා සාමාජික හැකියාව උත්තේජනය වන සහ සංවර්ධනය කරන ආකාරයෙන් ළමා දිවා සුරැකුම් සේවා සැපයීම ;

(ඈ) ළමුන් හදාවඩා ගැනීම, ඔවුන්ට ආරක්ෂාව සැලසීම හා ඔවුන්ගේ සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රමුඛ වගකීම දෙමව්පියන් සතු වන අතර, එම කාර්ය භාරයට සහාය වීම ;

(ඉ) I. දෙමව්පියන් සහ සමාජයේ අනෙකුත් සාමාජික පිරිස් සහභාගී කරවා ගන්නා ආකාරයෙන්; සහ

II. සමාජයේ බහු සංස්කෘතික සහ බහු භාෂාමය ස්වරූපය පිළිබිඹු වන ආකාරයෙන් ළමා දිවා සුරැකුම් සේවා සැලසුම් කිරීම හා සැපයීම.

ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය පරීක්ෂණය.

16. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ යටතේ පැනවූ විධිවිධාන සහ උපදෙස්වලට අනුකූල වීම සහතික කිරීමේ කාර්ය සඳහා පළාත් කොමසාරිස් හෝ බලයලත් නිලධරයකු -

(අ) ළමා දිවා සුරැකුම් සේවා සැපයීමට ඉදිරිපත්ව ඇති හෝ සපයන කවර හෝ පරිශ්‍රයකට දවසේ යුක්ති සහගත ඕනෑම අවස්ථාවක ඇතුළුවීමට හා පරීක්ෂා කිරීමට සහ ළමා දිවා සුරැකුම් සේවා සැපයීම අධීක්ෂණය කිරීම ;

(ආ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ කටයුතුවලට අදාළ යම් වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට, නියම කිරීමට සහ පරීක්ෂා කිරීම සහ පිටපත් ගැනීමේ කාර්ය සඳහා තාවකාලිකව ඒවා ඉවත් කිරීම ;

(ඇ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කවර හෝ කොටසක් හෝ දෙයක් මිනුම් ගත කිරීමට, පරීක්ෂා කිරීමට, ඡායාරූපගත කිරීමට හෝ රූපගත කිරීම ;

(ඈ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ඇති කවර හෝ දෙයක් හෝ කවර හෝ දෙයක හෝ දෙයකින් සාම්පලයක් විශ්ලේෂණය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ගැනීම ;

(ඉ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ උපකරණයක් හෝ පහසුකමක් ක්‍රියා කරවීමට හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ තැනැත්තකුට එම උපකරණයක් හෝ පහසුකමක් ක්‍රියා කරවන ලෙසට නියම කිරීම ;

(ඊ) මෙම ප්‍රඥප්තියට පටහැනිවීමක් සම්බන්ධයෙන් සාක්ෂියක් වන හෝ එලෙස සාක්ෂියක් ලෙස සැලකිය හැකි කවර හෝ දෙයක් භාරයට ගැනීම ;

(උ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ භාරකරුට හෝ එහි සිටින තැනැත්තකුට අනුකූලතා පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා නිලධරයාට සාධාරණ වශයෙන් අවශ්‍ය වන සහාය ලබා දෙන ලෙසට නියම කිරීම, කළ හැකි ය.

(2) (1) (අ) උපවගන්තිය ප්‍රකාරව පළාත් කොමසාරිස් හෝ බලයලත් නිලධරයකු විසින් යම් වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉවත් කරනු ලැබූ අවස්ථාවකදී, පළාත් කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයා විසින් -

(අ) එම අයිතම ලබාගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද, එම තැනැත්තාට එම අයිතම සඳහා රිසිට් පතක් ලබාදීම ; සහ

(ආ) එම අයිතම ලබාගත් කාර්ය සම්පූර්ණ වූ පසු බලපත්‍රලාභියාට එම අයිතම නැවත භාරදීම, කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය සිදු කිරීමෙන් පසු පළාත් කොමසාරිස් විසින්, පරීක්ෂා කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් බලපත්‍රලාභියා වෙත ලබාදිය යුතු ය.

(4) පරිශ්‍රයකට ඇතුළුවීමට පළාත් කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධරයකුට ඉඩ ලබා නොදෙන හෝ ඉඩ ලබා දීමට ප්‍රතික්ෂේප කරන යම් පුද්ගලයන් වරදක් සිදු කරන්නේ ය.

## *III* *වන කොටස*

## සාමාන්‍ය විධිවිධාන

17. (1) පළාත් කොමසාරිස් විසින්, ඔහුගේ අදහස පරිදි, යම් කොන්දේසිවලට යටත්ව, යම් නිලධරයකු වෙත බලතල, කාර්ය හා කර්තව්‍යවලින් යම් බලතල කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබිය හැකි අතර, එකී නිලධරයා විසින් තමා වෙත පවරනු ලැබූ එම බලතල, කාර්ය හා කර්තව්‍ය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය. බලතල කාර්ය හා කර්තව්‍ය පැවරීම.

(2) පළාත් කොමසාරිස්වරයා විසින්, ඔහු සුදුසු යැයි සලකනු ලබන විට දී, නිලධරයකු වෙත පවරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍යවලින් සියල්ල හෝ ඉන් කවරක් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය.

18. (1) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව එවැනි මධ්‍යස්ථානයක් පිහිටුවන හෝ බලපත්‍ර අවලංගු කිරීමෙන් පසුව ද ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ; ප්‍රඥප්තියේ විධිවිධානවලට පටහැනි ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම හෝ පවත්වාගෙන යාම වරදක් බව.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ වූ බලපත්‍රයක වලංගු කාලය ඉකුත් වූ පසුව ද ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන හෝ පරිපාලනය කරන ; හෝ

(3) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව ද එම මධ්‍යස්ථානය පවත්වාගෙන යන,

යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු -

(අ) එම වරද සිදු කරනු ලබන්නේ ප්‍රථම වතාවට නම්, රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ; හෝ

(ආ) එම වරද සිදු කරනු ලබන්නේ දෙවන වතාවට නම් හෝ ඊට වැඩි වාර ගණනක දී නම්, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත් කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම, යටත් විය යුතු ය

19. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලබා දීමට නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් ලබා දීමට අපොහොසත් වන හෝ ලබාදීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු - තොරතුරු සැපයීමට අපොහොසත් වීම හෝ අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම වරදක් වන බව.

(අ) එම වරද සිදු කරනු ලබන්නේ ප්‍රථම වතාවට නම්, රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට ; හෝ

(ආ) එම වරද සිදු කරනු ලබන්නේ දෙවන වතාවට නම් හෝ ඊට වැඩි වාර ගණනක දී නම්, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම.

යටත් විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් වාර්තාවකට හෝ ඉල්ලුම්පත්‍රයකට සිතාමතාම අසත්‍ය තොරතුරු සපයන හෝ අසත්‍ය හෝ වැරදි ප්‍රකාශ සිදු කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු -

(අ) එම වරද සිදු කරනු ලබන්නේ ප්‍රථම වතාවට නම්, රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයක් ද, හෝ

(ආ) එම වරද සිදු කරනු ලබන්නේ දෙවන වතාවට හෝ ඊට වැඩි වාර ගණනක දී නම් රුපියල් පනස් දහසකට වඩා නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම ද,

යටත් විය යුතු ය.

පොදු දඬුවම්

20. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පැනවූ යම් නියමයකට හෝ උපදෙසකට විධිවිධානයකට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

නියෝග.

21. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාවට නංවාලීමේ කාර්ය උදෙසා රෙගුලාසි සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවලට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින්, පහත එක් කරුණක් හෝ සියලු කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි පැනවිය හැකි ය :-

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කරුණු ;

(ආ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට දරුවකු ඇතුළත් කිරීමේ පදනම ;

(ඇ) ළමා දිවා සුරැකුම් සේවා වර්ග නියම කිරීම සහ ඒ එක් එක් වර්ගයක් සම්බන්ධයෙන් වෙනස් විධිවිධාන සැලසීම ;

(ඈ) ළමා දිවා සුරැකුම් සේවා සැපයීමට හෝ සැපයීමේ කාර්යයට සම්බන්ධවීමට හෝ ළමුන් ඇසුරෙහි තැබීමට සුදුසු හා යෝග්‍ය තැනැත්තකු ද යන කරුණු තීරණය කිරීමට අදාළ විධිවිධාන නියම කිරීම ;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කළ යුතු අපරාධ වාර්තා සහ තොරතුරු ඇතුළු ලිපි ලේඛන කවරක් ද යන්න නියම කිරීම ;

(ඊ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතා නියාමනය කිරීම ;

(උ) ළමා දිවා සුරැකුම් සේවා සැපයීමේ දී ළමුන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන අවශ්‍යතා නියම කිරීම ;

(ඌ) ළමා දිවා සුරැකුම් සේවා සැපයීමේ දී ගොඩනැගිලි සහ අනෙකුත් භෞතික පරිසර අවශ්‍යතා නියාමනය කිරීම ;

(එ) ළමා දිවා සුරැකුම් සේවා සැපයීමේ දී ක්‍රියාකාරකම් වැඩසටහන් සහ උපකරණ පිළිබඳ කරුණු නියාමනය කිරීම ;

(ඒ) ළමා දිවා සුරැකුම් සේවා පරිපාලනය, පවත්වාගත යුතු වාර්තා සහ යැවිය යුතු වාර්තා පිළිබඳ කරුණු නියාමනය ;

(ඔ) මෙම ප්‍රඥප්තිය යටතේ වන, කරුණු සම්බන්ධයෙන් ගාස්තු නියම කිරීම ;

(ඕ) ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල -

I. මෙහෙයුම් සැලසුම ;
II. කාර්ය මණ්ඩල පුහුණු කිරීම ;
III. සැලකිල්ල, ඉගෙනීම සහ ක්‍රීඩා කිරීම ;
IV. ළමුන්ගේ ආරක්ෂාව ;
V. ළමුන්ගේ සෞඛ්‍යය ;
VI. ළමුන්ගේ විශේෂ අවශ්‍යතා සහ ආබාධ ; සහ
VII. කාර්ය මණ්ඩලයේ හැසිරීම ;

යන කරුණු සම්බන්ධයෙන් පවත්වාගත යුතු ප්‍රමිති.

(ක) මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කළ යුතු යම් වාර්තාවක් ඇතුළත් විය යුතු කරුණු ;

(ග) පළාත් කොමසාරිස්වරයා විසින් පවත්වාගත යුතු පොත් හා ලැයිස්තු සහ ඒවායේ ඇතුළත් කළ යුතු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලු නියෝග ගැසට් පත්‍රයේ පළ කර ඒ පළ කරන ලද දින සිට මාස තුනක කාලයක් තුළ උතුරු පළාත් සභාවේ අනුමතය ලබා ගැනීම සඳහා උතුරු පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

(4) උතුරු පළාත් සභාව විසින් අනුමත නොකරන ලද සියලු නියෝග එම අනනුමතයේ දින සිට, ඒ යටතේ ඉන් පෙර සිදු කරන ලද යම් ක්‍රියාවකට අගතියක් සිදු නොවන සේ, අවලංගු වූවා සේ සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් අවලංගු වූවා යැයි සැලකෙන දිනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීමකින් දැනුම් දිය යුතු ය.

22. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය උදෙසා පළාත් කොමසාරිස් විසින්, කලින් කළ මාර්ගෝපදේශ පැනවිය හැකි ය. මාර්ගෝපදේශ.

23. (1) යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ආරම්භවීමේ දිනට ක්‍රියාත්මක වෙමින් සහ පවත්වාගෙන යමින් පැවති යම් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, මෙම ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ ඇතුළත් විධිවිධාන කෙසේ වුවද මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස හයක කාලයක් ඉකුත් වන තෙක් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට හා පවත්වාගෙන යාමට අවසර ලැබිය යුතු ය. ඉතිරි කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් හය මසක කාලසීමාව ඉක්ම යාමට පෙර එම උපවගන්තියේ සඳහන් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ එම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

24. මේ පනතේ දෙමළ හා සිංහල භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහෙතේ, එවිට, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි'' අර්ථ නිරූපනය.

''ළමයා'' යන්නෙන් වයස අවුරුදු පහට ඇතුළත් තැනැත්තෙකු අදහස් වේ. නමුත් අනුමැති අවශ්‍යතා සඳහා වයස, අවුරුදු එකේ සිට පහ දක්වා වන්නේ ය.

(අ) ළමා රෝග විශේෂඥවරයෙකු ;

(ආ) පරිවාස නිලධාරියෙකු ; සහ

(ඇ) පවුල් සුබසාධන නිලධාරියෙකු.

ගෙන් සමන්විත වන කමිටුවක නිර්දේශ මත පළාත් කොමසාරිස්වරයාට එවැනි ළමයෙකු ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයට ඇතුළත් කළ හැකි ය.

''ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය'' යන්නෙන් -

(අ) ළමයාගේ ඥාතියකු හෝ භාරකරු නොවන තැනැත්තකු විසින් ;

(ආ) ළමයාගේ නිවස නොවන යම් ස්ථානයක ; සහ

(ඇ) ළමයාට නිරන්තරයෙන් අධ්‍යාපනය සහ සුරැකුම් සේවා සැපයීමේ කාර්යයක් අතරවාරයේ දී,

ළමයාට අධ්‍යාපනය ලබාදීම ළමයා සුරැකීම අදහස් වේ ;

''අමාත්‍යවරයා'' යන්නෙන්, පරිවාස සහ ළමා රක්ෂක සේවා විෂයය පවරා ඇති උතුරු පළාතේ අමාත්‍යවරයා අදහස් වේ ; සහ

''තැනැත්තා'' යන්නෙන් යම් සංස්ථාපිත හෝ සංස්ථාපනය නොකරන ලද පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

11 - 852

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.